# නවරත්න විජේකෝන් පදනම

01. හැඳින්වීම

I නාමය :- නවරත්න විජේකෝන් පදනම වේ. මින් පසු මෙම ව්‍යවස්ථාවෙහි එය **“පදනම”** යනුවෙන් සඳහන් කරනු ලැබේ.

II ආරම්භක දිනය :- 2011 ජනවාරි මස වන 30 වන ඉරු දින වේ.

02. ලිපිනය :-
පදනමේ ලිපිනය සහ කටයුතු කරන ස්ථානයේ ලිපිනය අංක 111, විහාරමුල්ල, මොනරාගල හෝ විධායක සභාව විසින් ඉදිරියේදී තීරණය කරනු ලබන වෙන් අන් කිසි ස්ථානයක් වේ.

03. බල ප්‍රදේශය :-
පදනමේ ක්‍රියාත්මක බල ප්‍රදේශය මොනරාගල දිස්ත්‍රික්කය වේ.

04. පරමාර්ථ :-
මොනරාගල දිස්ත්‍රික්කය තුල...

(අ) පදිංචි දිළිඳු පවුල් වල දරුවන්ගේ පාසල් අධ්‍යාපනය හදාරණ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා කැපකරු මව්පියන් සම්බන්ධීකරණය කිරීම.

(ආ) පිහිටි ග්‍රාමීය දිළිඳු මට්ටමේ පාසල්, පූජනීය ස්ථාන, ක්‍රීඩා සමාජ සහ වෙනත් පොදු ස්ථාන සඳහා ක්‍රීඩා උපකරණ, පුස්තකාල පොත්, ප්‍රථමාධාර ඒකක ලබා දීම.

(ඇ) පදිංචි බරපතල රෝගාබාධ (තෝරාගත්) වලින් පෙලෙන අසරණ රෝගීන්ගේ ශල්‍යකර්ම සඳහා වන වියදම් හැකි අයුරින් පියවීමට කටයුතු කිරීම.

(ඈ) ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනිම සහ පරිසරය සුරැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඉ) පදිංචි ග්‍රාමීය ජනතාවගේ සනිපාරක්ෂක අවශ්‍යතා සඳහා අවශ්‍ය පහසුකම් හා උපකරණ ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ඊ) පිහිටි පාසැල් වලට තොරතුරු තාක්ෂණ පහසුකම් ලබාදීමට, ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(උ) ජීවත්වන දරුවන්ට වෘත්තීය අධ්‍යාපන පහසුකම් ලබාගැනීම සඳහා එම වෘත්තීය අධ්‍යාපන ආයතනවල ශාඛා මොනරාගල නගරයේ ඇතිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ඌ) ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආගමික සංස්කෘතික හා සාමාජයීය උන්නතිය සඳහා වූ වෙනත් පොදු කටයුතු සංවිධානය කිරීම, ආධාර උපකාර කිරීම.

05. සාමාජිකත්වය :-

(අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පදිංචි, වයස අවුරුදු 18 ට වැඩි ස්ත්‍රී/පුරුෂ ඕනෑම කෙනෙක් පදනමේ සාමාජිකත්වය ලැබීමට සුදුස්සන් වේ.

(ආ) සාමාජිකත්වය ඉල්ලා සිටින සෑම කෙනෙක්ම ව්‍යවස්ථාවේ නියමිත උපලේඛනය අංක 01 ආකෘති පත්‍රයේ එම ඉල්ලීම කළ යුතුය.

(ඇ) පදනමේ ව්‍යවස්ථාව කඩකළ බව ඔප්පු වූ හෝ පදනම අපකීර්තියට පත්වන ආකාරයට කටයුතු කරන කවර පුද්ගලයෙකුගේ වුව සාමාජිකත්වය තහනම් කිරීමට විධායක සභාවට බලය ඇත්තේය.

06. සාමාජික නාමාවලිය :-

සාමාජිකත්වය අහෝසිවීම, ඉල්ලා අස්වීම, සාමාජිකත්වයෙන් නෙරපීම, සාමාජිකයාගේ අභාවය ආදී සළකා බලා නිවැරදි සාමාජිකයන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාමට භාණ්ඩාගාරිකගේ සහයෝගය මත ප්‍රධාන ලේකම් තැන වගකිව යුතුවේ.

07. විධායක සභාව :-

(අ) විධායක සභාව සභාපති, ලේකම් භාණ්ඩාගාරික ලෙස තිදෙනෙක් (03) ක් ද උප සභාපති හා උප ලේකම් කෙනෙක් බැගින් දෙදෙනෙක් (02) ද, තවත් විධායක සභිකයන් සතර (04) දෙනෙකුගෙන් ද සමන්විත විය යුතුය.

(ආ) මේ සියළු දෙනාම වාර්ෂික මහාසභා රැස්වීමකදී ඊට පැමිණ සිටින පදනමේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත් කරගත යුතුය.

08. අනුශාසකවරු :-

(අ) පදනමට පැවිදි අනුශාසකවරයෙක් හෝ කිහිප දෙනෙක් පත් කරගත හැකිය.

(ආ) පදනමට ගිහි අනුශාසකවරු තිදෙනෙකු පත් කරගත හැකිය. මෙම ව්‍යවස්ථාවේ 4 (ඇ) ඡේදයේ පරිදි කටයුතු කිරීමේදී උපදෙස් ලබාගැනීම සඳහා ඉන් එක් අනුශාසක වරයෙකු අනිවාර්යෙන්ම මොනරාගල මහ රෝහලේ සේවය කරන වෛද්‍ය වරයෙකු විය යුතුය.

(ඇ) මෙහි සියළු අනුශාසක ධූරයන් පදනමේ වාර්ෂික මහාසභා රැස්වීමකදී පැමිණි සාමාජිකයින්ගෙන් ඒකමතිකව සිදුවිය යුතු අතර වාර්ෂික මහාසභා රැස්වීම් දෙකක් අතර යම් අනුශාසක වරයෙකුට සිය ධූරයේ කටයුතු කිරීමට අපහසු වන අවස්ථාවක තාවකාලිකව අදාළ වන අනුශාසක වරයෙකු පත්කර ගැනීමට පදනමේ විධායක් සභාවට බලය ඇත.

(ඉ) පදනමේ සියළු ආකාරයේ ක්‍රියා පටිපාටින් අධීක්ෂණය කිරීමට, අනුශාසක මඬුල්ලට හැකියාව ඇත. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීමට සෑම විටම ප්‍රධාන ලේකම් තැන වග බලා ගත යුතුය.

09. ගණන් පරීක්ෂක :-
පදනමේ ගණන් හිලව් පරීක්ෂා කිරීම පිණිස මහා සභාව විසින් ගණන් පරීක්ෂකවරයෙකු පත්කර ගත යුතුය. ගණන් පරීක්ෂා කිරීම පදනමේ වාර්ෂික මහාසභා රැස්වීමට පෙර සම්පූර්ණ කල යුතු වන්නේය.

10. නිළයෙන් ඉවත් කිරීම :-
පත් කර ගනු ලැබූ ඕනෑම විධායක සභියෙකු ගණන් පරීක්ෂකයකු හෝ මහාසභා රැස්වීමකදී ඊට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසකගෙන් (2/3) සම්මත වූ යෝජනාවකින් මිස, වෙන අන් ලෙසකින් ඉවත් කල නොහැක්කේය. එසේ වූ නමුත් එබඳු කවර කෙනෙකු වුව ද තාවකාලිකව නිළයෙන් අත්හිටු වීමට විධායක සභාවට බලය ඇත. එසේ ක්‍රියාකල කල්හී ඒ ගැන වැඩි දුරටත් ක්‍රියකිරීම සඳහා හෝ විධායක සභාව ගත් පියවර ස්තිර කිරීම සඳහා හෝ එම කරුණ ඊළඟ මහාසභා ැස්වීමට ඉදිරිපත් කල යුතුය. මහාසභා රැස්වීම් දෙකක් අතරතුර කාලයේදී ඇති වන ඇබෑර්තු විධායක සභාව විසින් පිරවිය යුතුය.

11. පොත්පත් පරීක්ෂණය :-
පදනමේ අරමුදල කෙරෙහි සැලකිල්ලක් දක්වන ඕනෑම සාමාජිකයෙකුට පදනමේ පදනමේ සාමාජික නාමාවලිය හා ගණන් පොත්පත් පරීක්ෂා කර බැලීමට උවමනා වී ඒ බව දින 14 කට කලින් ප්‍රධාන ලේකම් තැනට ලියවිල්ලකින් දැනුම් දී පැමිණි විට ඊට ඉඩදිය යුතුය.

12. රැස්වීම :-

I) **<u>වාර්ෂික මහාසභා රැස්වීම් :-</u>**

(අ) පදනමේ වාර්ෂික මහා සභා රැස්විම තුන් අවුරුද්දකට වරක් මුදල් වර්ෂයෙන් (එනම් පළමු වර්ෂයේ ජනවාරි මස 01 වන දා සිට තුන්වන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දා වූ කාලයෙන්) පසුව හැකිතාක් ඉක්මණින් එහෙත් ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වනදායින් මෙපිට පැවැත්විය යුතුය. මේ රැස්වීම සඳහා අවශ්‍ය ගණ පූර්ණය සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් 1/3 විය යුතුය.

(ආ) වාර්ෂික මහාසභා රැස්වීමක් පැවැත්වීමට යටත් පිරිසෙයින් දින විසි එකකට (21) පෙර ඒ බව ලේකම් තැන විසින් සියළුම සාමාජිකයන්ට දැනුම් දිය යුතුය.

(ඉ) වාර්ෂික මහාසභා රැස්වීම පිළිබඳ නිවේදනයෙන් දින හතක් (07) ඇතුළත සාමාජිකයෝ තමන් විසින් ඉදිරිපත් කිරීමට අදහස් කරන ව්‍යවස්ථා සංශෝධන යෝජනා සහ නිළධාරීන් තේරා පත් කර ගැනීමේ නාම යෝජනා ද ලේකම් තැන වෙත යැවිය යුතුය.

(ඊ) ලේකම් තැන විධායක සභාව විමසා මහාසභා රැස්වීම සඳහා ඉහත යෝජනා ආදිය ඇතුළත් න්‍යාය පත්‍රයක් පිළියෙල කොට එය රැස්වීම පැවැත්වීමට යටත් පිරිසෙයින් දින හතකට (07) කලින් සාමාජිකයින්ට ලැබෙන්නට සැළැස්විය යුතුය.

II) **විශේෂ මහා රැස්වීම**

(අ) සභාපති තැන විසින් ලිපියකින් ඉල්ලා සිටි විට හෝ

(ආ) විධායක සභාවේ තීරණය පිට හෝ

(ඉ) දින 14 ක් කල් දෙමින් සාමාජිකයින්ගේ 1/3 කට නො අඩු පිරිසක් විසින් අත්සන් කොට ප්‍රධාන ලේකම් තැන වෙත ඉදිරිපත්කල ලියවිල්ලකින් ඉල්ලුම් කළ විට හෝ

විශේෂ මහාසභා රැස්වීම කැඳවිය යුතුය. ඉල්ලා සිටීම හෝ තීරණය හෝ ඉල්ලු දින සිට දින 07 ක් ඇතුලත රැස්වීමේ අරමුණ ද දක්වා යවමින් ලේකම් තැන විශේෂ මහාසභා රැස්වීම කැඳවිය යුතුවේ. එසේ දක්වා යැවූ අරමුණ හැර වෙන කිසිවක් එම රැස්වීමේදී සාකච්ඡා නොකළ යුතුය. කවර විශේෂ මහාසභා රැස්වීමකට වුවද අවශ්‍ය ගණ පූර්ණය මෙම ව්‍යවස්ථාවේ 12 වන පරිච්ඡේදයේ (අ) වගන්තියේ සඳහන් ගණ පූර්ණයම වන්නේය.

III) **විධායක සභා රැස්වීම සහ මහාසභා රැස්වීම**

අවශ්‍ය අවස්ථාවන්හී හෝ අඩු වශයෙන් තුන් මසකට වරක් විධායක සභාව රැස්විය යුතුය. ගණ පූර්ණය විධායක සභාවෙන් දෙකෙන් පංගුව (1/2) කට නොවැඩි විය යුතු අතර මහාසභා සඳහා සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් එකක් (1/3) විය යුතුය.

13. වාර්ථා :-
සෑම රැස්වීමකම (විධායක සභා/ මහාසභා/ විශේෂ මහාසභා/ වාර්ෂික මහාසභා) වාර්ථාවක් සටහන් කර ගැනීමටත් එය ඊළඟ එවැනි රැස්වීමකදී කියවා සම්මත කර ගැනීමටත් ලේකම් තැන වගකිව යුතුය.

14. ඡන්දය විමසීම :-
රැස්වීම පැමිණි සාමාජිකයින්ගේ වැඩි දෙනාගේ ඉල්ලීම පිට රහස් ඡන්දය විමසිය යුතු වූ විට හැර අන් හැම අවස්ථාවකදීම ඡන්දය දීම අත් එසවීමෙන් කල යුතු වන්නේය.

15. කලයුතු ගෙවීම් :-

(අ) සෑම සාමාජිකයකු විසින්ම සිය වාර්ෂික සාමාජික මුදල වශයෙන් රුපියල් එකසිය විස්සක් (රු.120/=) ගෙවිය යුතුය. මේ සාමාජික මුදල් ප්‍රමාණය වාර්ෂික මහාසභා රැස්වීමකදී වෙනස් කල හැකි වේ.

(ඇ) පදනමට ගෙවනු ලබන්නා වූ සෑම මුදලක්ම වෙනුවෙන් භාණ්ඩාගාරික තැන නිල කුවිතාන්සියක් නිකුත් කල යුතු වන්නේය.

16 අරමුදල් :-

(අ) පදනමේ අරමුදල් සම්පාදනය කිරීම සඳහා විධායක සභාවේ හෝ මහා සභාවේ අනුමැතිය මත නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සංවිධානය කල හැකිය. ඊට අමතරව ඕනෑම පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක ආධාර, පරිත්‍යාග භාර ගැනීමට ද හැකිය.

(ආ) පදනමේ අරමුදල් විධායක සභාවේ අනුමැතියට යටත්ව පරිපාලන වියදම් පිණිස සහ මහාසභාවේ එකමතික අනුමැතියකට යටත්ව මෙම ව්‍යවස්ථාවට අනුකූල පොදු යහපත සඳහා වූ කාර්යයකට මිස වෙනත් කවර ආකාරයක කාර්යයකට හෝ යෙදිය නොහැක්කේය.

(ඇ) පදනමේ අරමුදල්, ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා පරිශීලනයට යෝග්‍ය පරිදි මහාසභාව විසින් තීරණය කරනු ලබන රාජ්‍ය බැංකුවල සහ අවශ්‍ය විටෙක සමුපකාර හෝ පෞද්ගලික බැංකුවල පදනමේ නමින් සභාපතිගේ, ලේකම්ගේ සහ භාණ්ඩාගාරිකගේ අත්සන් පිට ඉතිරි කිරීමේ ගිණුම් සහ ජංගම ගිණුම් වල තැන්පත් කල යුතුය. බැංකු ගිණුම් ආරම්භ කල පසු ඊළඟ මහාසභා රැස්වීමේදී ගිණුම් අංක සියළුම සාමාජිකයින්ට දැන්විය යුතුය.

(ඈ) සභාපතිගේ සහ භාණ්ඩාගාරිකගේ හෝ ලේකම්ගේ අත්සන් පිට පදනමේ අරමුදල් බැංකුවෙන් අස්කරගත හැකිය.

(ඉ) කිසිම අවස්ථාවක සාමාජික මුදල් වශයෙන් වෙන යම්කිසි ක්‍රමයකින් හෝ ලැබෙන මුදල් වලින් රු.2,500.00 කට වැඩි ප්‍රමාණයක් තමා භාරයේ තබා ගැනීමට භාණ්ඩාගාරික තැනට නොහැකිය. ඊට වැඩිවන සෑම මුදලක්ම ඔහු වහාම බැංකුවේ තැන්පත් කල යුතුය.

17 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම :-

මෙම ව්‍යවස්ථාවේ අඩු වැඩි කිරීම්, වෙනස් කිරීම් ආදී කවර ක්‍රමයකින් හෝ සංශෝධනය කරන්නේ නම් එසේ කල හැක්කේ පදනමේ වාර්ෂික මහසභා රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකොටසකගෙන් (2/3) අනුමත වූ යෝජනාවකින් පමණි.

18 විසුරුවා හැරීම :-

පදනම විසුරුවා හැරීමත්, පදනමේ ගෙවිය යුතු සියළු නීත්‍යානුකූල වියහියදම් ගෙවීමෙන් පසු එහි අරමුදල ගැන ක්‍රියාකිරීමත් ඒ සඳහා කැඳවන ලද විශේෂ මහාසභා රැස්වීමකදී ඊට පැමිණ සිටින ඡන්ද බලය හිමි සාමාජිකයින්ගේ තුනෙන් දෙකොටසකගෙන් (2/3) සම්මත වූ යෝජනාවකින් තීරණය වන පරිද්දෙන් කළ යුතුය.

.................................

ලේකම්තැනගේ අත්සන